# තනතුරු පුරප්පාඩු

## සීමාසහිත හිරියාල විවිධ සේවා සමුපකාර සමිතිය - ඉබ්බාගමුව

සීමාසහිත හිරියාල විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩුව පවතින කළමනාකරණ සහකාර තනතුර සඳහා බඳවා ගැනීමට ප්‍රමුඛතා ලේඛනයක් පිළියෙල කිරීමේ අරමුණින් සුදුසුකම් සපුරා ඇති සමිතියේ **සේවයේ නියුතු අභ්‍යන්තර සේවකයින්ගෙන් හා සමිති බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක්** අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් භාර ගැනීම **2026/07/31** දින දක්වා පමණි. මීට අදාල අයදුම්පත්‍ර ඉබ්බාගමුව සමිති ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පිහිටි නියෝජිත තැපැල් කාර්යාලයෙන් ලබා ගෙන අධ්‍යාපන සහතික, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, ක්‍රීඩා, පරිගණක, වෙනත් සහතිකවල ඡායා පිටපත්, පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකයක්ද සමග අයදුම්පත් භාර ගන්නා **2026/07/31** දිනට පෙර සාමාන්‍යාධිකාරී, සී/ස හිරියාල විවිධ සේවා සමුපකාර සමිතිය, ඉබ්බාගමුව යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** යොමු කළ යුතුය. අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන **2026/07/31** දිනට පසු ලැබෙන අයදුම්පත්‍ර කිසිදු හේතුවක් මත භාර ගනු නොලැබේ.

## වැටුප් චක්‍රලේඛ 02/2025 A ශ්‍රේණිය

**01. වැටුප් සංකේත OL කළමනාකරණ සහකාර [III] ශ්‍රේණිය තනතුර:**

**වැටුප් පරිමාණය :-** 28,500.00 - 400 X 10, 440 X 11, 500 X 10 = 42,340.00

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-**

**බාහිර බඳවා ගැනීම් (විවෘත)**

අ. අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් ගණිතය, සිංහල / දෙමළ ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් සමත්වීම.

**අභ්‍යන්තර බඳවා ගැනීම් (සීමිත)**

ආ). ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ පාඨමාලාව / සමුපකාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව සමත්වීම සමග MSSL (T) වැටුප් පරිමාණයේ හෝ MSSL වැටුප් පරිමාණයේ තනතුරක වසර 10 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම..

**තනතුරට අදාළ වෙනත් දීමනා හා වරප්‍රසාද :**

- සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායක වීම සහ වයඹ පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වීම
- වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවෙන් අනුමත අනෙකුත් දීමනා
- දේශීය හා විදේශීය සංචාර
- වාර්ෂික නිල ඇඳුම්
- වාර්ෂික ප්‍රසාද දීමනා
- සේවක සුබසාධක අරමුදලේ අනුමත ප්‍රතිලාභ හා අනිකුත් වරප්‍රසාද

**සැලකිය යුතුයි :**

- සෑම අයදුම්කරුවෙකුගේම වයස් සීමාව, අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන 2026/ 07/ 31 දිනට අවු.18 ට නොඅඩු හා අවු.45 ට නොවැඩි විය යුතුය.
- සමිතියේ අභ්‍යන්තර සේවකයන් සඳහා බඳවා ගැනීමේ උපරිම වයස් සීමාවක් බලපානු නොලැබේ.
- අභ්‍යන්තර සේවකයෙකු ලෙස සලකනු ලබන්නේ සමිතියේ තනතුරකට පත්වීමක් ලබා ඒ සඳහා වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවෙන් අනුමත වූ සේවකයින් පමණක් වේ.
- තනතුර සඳහා බඳවා ගැනීමේදී සමිති අභ්‍යන්තර සේවකයින්ට ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ. අභ්‍යන්තර සේවකයින්ගෙන් පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි වුවහොත් ඒ සඳහා බාහිර අයදුම්කරුවන් වෙනුවෙන් තරග විභාගයක් පවත්වා ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.
- සෑම අයදුම්කරුවෙකුම ආපසු නොගෙවනු ලබන රු. 750/- ක විභාග ගාස්තුවක් ඉබ්බාගමුව සමිති ප්‍රධාන කාර්යාලයේ පිහිටි නියෝජිත තැපැල් කාර්යාලය වෙත ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය.
- සෑම අයදුම්පත්‍රයක්ම සමිතිය මගින් නිකුත් කරන ලද අයදුම්පත්‍රයක් විය යුතු අතර, එම අයදුම්පත්‍රය ඉබ්බාගමුව සමිති ප්‍රධාන කාර්යාලයේ පිහිටි නියෝජිත තැපැල් කාර්යාලයෙන් මිලදී ගැනීමට කටයුතු කළ යුතුය.

**මෙයට,**
**එච්. වීරසූරිය දයානන්ද**
**සාමාන්‍යාධිකාරී.**
**සී/ස හිරියාල විවිධ සේවා සමුපකාර සමිතිය - ඉබ්බාගමුව.**

**දුරකථන : 037 2259667 / 037 2259898**

**2026.07.03**